




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තෝරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## හත්පෙති මල රැගෙන ගිය පාසල් මිතුරාට...

**කලහ කර ගතිමු අප එදවස**
**පාසලේ එක වසරේ**
**හත්පෙති මල* පොතට**
**පොත දිනා දී මා හට**
**මල රැගෙන ගියාද සකි නුඹ**

**පාරිභෝජන පැතුම්**
**පරහිත චේතනා අතරේ**
**ගැටෙමින් ශේන්යා සේ**
**කාලේ ගතවුණා මිතුරේ**

**දුටුවේ යළිත් නුඹ**
**දසක දෙකකුත් ටිකකට පසුව**
**හත්පෙති මලින් පල ලැබ**
**එන හැටි හිනා මල් අරගෙන**

**කහ පෙත්ත ගඩොල් පෝරණුවකි**
**රතු පෙත්ත කුබෝටා ටැට්ටරේ**
**තද නිලට තැපැල් නයින්ටියක්**
**කොළ එකට ගේ පොඩියක්**

**තැපැල් නයින්ටි ලඩියේ**
**හාල් එළවළු මල්ලේ**
**පැත්තක බාග ගල් බෝතලේ**
**රැගෙන යනවා නුඹ**
**දරු වඩා තරවුණු**
**බිරිඳකුත් පටවාන පසුපස**

**බල බලා නුඹ දෙස**
**නෑ හිතවතුන් කියති මට**

**පෙති කඩා විසිකර**
**කිසිවකුට පල නැති දේ ලද**
**ඒ කථාවේ**
**ශේන්යා වගෙයිලු මම**

**රණ්ඩු කර උදුර ගත් පොත**
**විතරයිලු තාමත් මා ළඟ**

* වලෙන්තීන් කතායෙව්ගේ හත්පෙති මල නමැති සෝවියට් ළමා කෘතිය

ඉසුරු ප්‍රසංග
('නෙත් සර සඳෙස' කාව්‍ය සංග්‍රහය -

රුසියානු ළමා සාහිත්‍යය කෘතියක එන එක්තරා චරිතයක් ගැන නොස්ටැල්ජීය මතක අවදිකරමින් ලියැවෙන මේ කව කිසිසේත්ම නොස්ටැල්ජික කවියක් නම් නොවේ. මෙහි ලියැවී ඇත්තේ වර්ථමානයයි. පෙනි පෙනී අප අත්දකින යතාර්ථයයි. ඒ අප සිත් පැහැරගත් ළමා කතාවක එක්තරා සිද්ධියක් ඇසුරෙනි. ශේන්යා නම් කුඩා ගැහැණු ළමයකු වටා ගෙතුණු කතාවකි ඒ. එය සොයාගෙන කියැවීම පාඨක ඔබට බාර කොට ඉසුරු විසින් ලියා ඇති මේ කව දෙසට මම එක එල්ලේම හැරෙන්නෙමි.

කතුවරයා තම ළමා කාලයේ සිදුවූ පුංචි සිද්ධියක් මතක් කරදෙන්නේ මේ කවට ඌනපූරණයක් වශයෙනි. තමා පළමු වසර පංතියේ සිටිනා කාලයේ තම මිතුරෙකු සමග සිදුවූ කලහයක් ගැන ඔහු අපට කියයි. ඒ 'හත්පෙති මල' නමැති ළමා කතා පොතට ඔවුන් අතර සිදුවූ පුංචි රණ්ඩුවකි. එය කෙසේ හෝ අවසන් වන්නේ කවියා විසින් පොත දිනා ගැනීමෙන් අනතුරුවය. එය ඔහුට සතුටකි. ඔහුගේ මිතුරා පරාද විය. මේ කවියේ පළමු කොටසේ අවසාන බාගයෙන් ඔහු අපට කියන තවත් යමක් ඇත. හත්පෙති මල පොත ඔහුට දිනා දුන්නද, පෙත්ත පෙත්ත කඩා විසිකරමින් සිතූ පැතූ සමපත් ලද හැකි ඒ මහාර්ඝ මල, හේ අරන් ගිය බවයි. ඉදින් හත්පෙති මල නැති හත්පෙති මල පොතකින් වැඩක් ඇත්තේ කාටද? ඒ කුඩා කාලයේ අතීත සිදුවීම එහෙමම අතීතයට එකතුවේ. ඒ එහිම සැඟවුණු ගැබ්වුණු වෙනත් අරුතක් අපට කියා පාමිනි.

ඉන් අනතුරුව කාලය ඔහේ ගලාගෙන යයි. මේ අතර බොහෝ දේවල් සිදුවේ; වෙනස් වේ. එනම් ඒ කාලය අතරතුර මේ පරිභෝජනවාදී සමාජය ඇතුළත අනුන්ගේ ඕනෑ එපා කම් සොයා ඇවිදිමින් තමන් වෙනුවෙන් කිසිම දෙයක් කරගන්නේ නැතුව තමාගේ කාලයද ගතවූ බවක් කතුවරයා පවසයි. හේ, එසේ වන්නට හේතු වූ කරුණු කාරාණා ඉදිරිපත් නොකරයි. එය ඔහුගේ කනසල්ලට හෝ සතුටට හේතුවක් දැයි අපට උලුප්පා නොපෙන්වයි. ඔහු ඇත්ත ඇති සැටියෙන්ම කැඩපතක් සේ විශද වන්නට අවකාශ තනයි; විධාරණය වන්නට ඉඩ හරී. තමාගේ සුබසිද්ධිය හෝ සුබ විහරණය නොපතා පරාර්ථකාමී චර්යාවන් හි තමා නිරත වුණේ, ඒ කතාවේ ශෙන්යා සේම බව අවධාරණයෙන් කියා සිටී.

ඊට වසර විස්සකට විතර පසු නැවතත් ඔහුට අර තම කුඩා කල මිතුරා මුණගැසේ. බැලූ බැල්මට ඔහු ජීවිතය ජයගත් සෙයක් දිස්වේ. ඒ හරියට අවැසිම දෙයක් පතාගෙන පෙත්තක් කඩා විසිකළ සැණින් සියල්ලම ලැබෙන හත්පෙති මලින් පල ප්‍රයෝජන ලැබුවා සේය. නමුත් අහම්බෙන් ඔහුව දකින අප කවියාට, ඔහුගේ සාර්ථකත්වයේ බාහිර පෙනුම යටින් අතීත කතාවක මතක හෙමි හෙමින් මතුවීම වළහාලිය නොහැක. අප කවියා ඉතාමත් මැදිහත් සිතින් ඒ දෙස බලයි. ඔහුගේ මිතුරා ඔහු වෙත එන්නේ හිනා මල් අරගෙනය. ඒ ඔහුගේ ජීවිත ගමනේ සාර්ථකත්වයයි; සතුටයි; රැගෙන ගිය හත්පෙති මලේ ආනුභාවයි.

ඉන් අනතුරුව ඔවුනොවුන් ආ ගිය තොරතුරු කතා කරන්නට ඇත. අප කවියා ඔහුගේ ජීවන දර්ශනයත්, ඔහු මෙතුවක් කළ කී දෑත් කියන අතර ඔහුගේ හත්පෙති මල අරන් ගිය මිතුරාත් ඔහුගේ ජීවිත ප්‍රවෘත්ති කියන්නට ඇත. ඉන් බිඳුවක් කවියා අප වෙනුවෙනුත් දිග හරී.

මේ වසර විස්සකට නොඅඩු කාලය තුළ ඔහුගේ පාසල් මිතුරා ගඩොල් පෝරණුවක්, ට්‍රැක්ටරයක්, මෝටර් බයිසිකලයක් හා පුංචි ගේ පොඩියක් ආදී දෑ හෙමි හෙමින් රැස් කර ගත් බවක් අපට දැන ගන්නට ලැබේ. ඒ හරියට කුඩා කළ හේ අරන් ගියා යැයි කියූ හත්පෙති මලේ කහ, රතු, නිල් හා කොළ ආදී පෙති පෙති කඩා වීසිකොට තමාට රිසි දෑ ඒ ඔස්සේ ලබාගත්තා වාගේය. එසේ ලබා ගත් ජයග්‍රහණය තුළ උත්ප්‍රාසයක් නැත්තේම නැත. ඒ තමන්ගේ වෙර වීරියෙන් ලැබූ දෙයක් වෙනුවට අන් යම් දෙයක උදව්වෙන් ළඟා කරගත් සම්පතක් තමා සතු කරගත්තා වාගේය යන්නයි. අප කවියා නොකියා කියන්නේ, ඔහුගේ මිතුරා විවාහයෙන් පසුව ලද දෑවැද්ද හෝ බිරිඳගේ පාර්ශවයෙන් ලද යම් දෙයකින් එවැනි සමාජ තත්ත්වයක් අත්පත් කරගත් බවක් දැයි අපි නොදනිමු. අනෙක් අතට පරිභෝජනවාදී සමාජයක තම මිතුරා අත්පත් කරගෙන තිබෙන බාහිර දෑ කෙනෙකුගේ සාර්ථකත්වය හෝ සතුට මනින මිනුම් දඬු වී තිබීමයි. නමුත් ඒ කාලය තුළ අප කතිකයා මොනවා අත්පත් කරගන්නට ඇත්ද? එය ගැටළුවකි. එම කරුණ කවිය ඇතුළේ සැඟවී හිඳිමින් අපට නෙක අරුත් ජනනය කරයි.

තම මිතුරාගේ ඒ සාර්ථකත්වයේ කතා පුවත යටින් ඇති තවත් කතාවක් ඔහු අපට ඊළඟ පැදියෙන් පෙනෙන්නට ඉඩහරී. වාහනයක් කියා නමට තිබුණද එය කසි කබල් තැපැල් නයින්ටියකි. මේ පරිභෝජනවාදී සමාජය විසින්ම නඩත්තු කරන්නැයි ඉල්ලන මධ්‍යම පාංතික ජීවිතයට වඩාත් හොඳින්ම ගැලපෙන්නකි ඒ. එළවළු මල්ලකුත් එහි එල්ලගෙන, දරුවන් වඩා තරවුණ බිරිඳකුත් පටවාගෙන ගමන් යන ඔහුගේ ඒ 'සාර්ථක' ජීවිතය මෙයාකරාව චක්‍රියව සිදුවන්නක් විය යුතුය. කවියා විසින් සීරුවට නිරීක්ෂණය කළ දෙයක්ද ඒ අතර ඇත. ඒ එළවළු මල්ලේ පැත්තක සැඟවී නොසැඟවී තිබෙන බාගේ ගල් අරක්කු බෝතලයයි. එය කුමක් සංකේත කරනවා විය හැකිද? බාගේ බෝතලයක් නම් තනි ප්‍රයෝජනයටමය. සාදයක් හෝ උත්සවයක් සඳහා එය කිසි සේත් ප්‍රමාණවත් නොවේ. නිවසට අත්‍යවශ්‍ය එළවළු තුනපහ මල්ලේම අවැසිම දෙයක් සේ එය රැඳී තිබීමෙන් එය අප මිතුරාගේ ජීවිතයට කොයිතරම්ම අත්‍යවශ්‍ය සමීප භාණ්ඩයක් වී ඇත්දැයි ඉඟි පහලවේ. ඉතින් මේ සාම්ප්‍රදායිකව සාර්ථක යැයි නෑ හිත මිත්‍රාදීන් විශ්වාස කරන ඔහුගේ හද ගැබ දැවෙන ඒකාකාරී ප්‍රශ්න වලින් බිඳුවකට හෝ මිදෙන්න ඔහුට ඇති එකම ප්‍රායෝගික පිළිතුර විය හැක. ඔහු පිටට නොපෙන්වන, පිටතවුන් ඔහුගෙන් නොදකින 'සාර්ථකත්වය' එය විය නොහැකිද? හත්පෙති මලෙන් පෙත්තක් කඩා විසි කොට ලබා ගත් දෙයක් නොවේ ඒ. එය ඔහුගේ ආත්මීය දුක්ඛ වේදනාවන් යන්තමින් හෝ සමහන් කරගැනීමට ඔහු විසින්ම සොයා පාදා ගත් රහසිගත ඔසුවකි. අප බොහෝ දෙනාගේ ජීවිත එවැනිය. ඒකාකාරීය. එකම කටුක යතාර්ථයක් නඩත්තු කරමින් එය ඔහේ ගෙවී යයි. ඉතින් මේ හත්පෙති මල දිනා ගත් ඔහුගේ මිතුරාට ඉන් පෙත්තක් කඩා විසිකොට ලබා ගන්නට බැරි වූ එකම දෙය 'සතුට' බව කතිකයා නොකියා කියයි.

ජීවිතයේ සැබෑ සතුට යනු වාහනයක්, ගෙයක් දොරක්, බිරිඳක් හෝ දරුවන්ම පමණක් නොවන බව හේ අවධාරණය කරයි. ඒ අතින් බලන කළ මේ වසර විස්සට අපගේ කවියා ඒ කිසි දෙයක් අත්පත් කරගෙන නැතුවා විය හැක. නමුත් ඔහුගේ පරහිතකාමී පැතුම් අතරේ ඔහු තෝරාගත් මාවතේ ඔහුගේ සතුට මහා ඉහළින් තිබෙනවා විය හැක. ඒ කෙසේ වෙතත් ඒවා සමාජයට නොවැදගත්ය. විශේෂයෙන්ම නෑ හිත මිතුරන්ට ඒවා කිසිසේත්ම අදාල නැත. ඔවුහු මිනිසකුගේ සතුට හෝ සාර්ථකත්වය අර මුලින් කියූ මිනුම් දඬු ඔස්සේම මැන බලති. ගෙයක් දොරක්, වාහනයක්, බිරිඳක් හා දරුවන් ලද සැණින් සියල්ලම ඉටුවූ සේ සිතන පරිභෝජනවාදී සමජායක නිරාමිස සතුට යනු එක්තරා ආකරයක විහිළුවකට එහා නොගිය කිසිවක් මිස අන් යමක් නොවේ.

මේ කවියේ අග භාගයෙන් හේ අපට කියන්නේ මේ තිත්ත ඇත්තයි. ඔහුගේ නෑ හිතවතුන් ඇඟිල්ලෙන් ඇන ඇන තම මිතුරාගේ බාහිරින් පමණක් පෙනෙන සාර්ථකත්වය පෙන්න පෙන්නා තමන් කිසිම කමකට නැති කිසි දෙයක් කර නොගත්ත කෙනෙකු ලෙස හංවඩුගහන බවයි. ඔවුන් කිසිවෙකුට අප කවියා දුටු පරිදි, තම මිතුරාගේ සැබෑ ජීවිත අභ්‍යන්තරයට කිඳා බැස මේ සමාජයේ සියල්ලන් සේම ඔහුත් විඳින මුහුණ දෙන ජීවන ප්‍රශ්න, තිත්ත කටුක යතාර්ථය ගැන සවිඥානකව බලන්නට පුළුල් දෑසක් නැත. එලෙසම අප කවියාගේ ජීවිතයත් ඒ තුළ ඔහු විඳින සරල සැහැල්ලුව හා සතුටත් මැන ගන්න ඔවුනට මාන නැත. ඉතින් මේ අන්ත දෙක දිහා වෙන වෙනම බලමින් ඔවුන්ගේ කෝදුවලින් එකිනෙකා ගැන එලෙස ගන්නා තීන්දු හා තීරණ එතරම්ම සරල නොවේ; සාධාරණද නොවේ. ඔවුහු හත්පෙති මලේ පෙති කඩ කඩා පල නැති දේ ලබමින් ජීවිතය නිකරුණේ නැති නාස්ති කරගත් ශේන්යාගේ චරිතය අප කවියා මත සම්පාත කරති. ඔවුන් පුන පුනා කියන්නේ එ'දවස රණ්ඩු කරගෙන උදුරගත් පොත විතරක්ම ඔහු ගාව තිබෙන බවත් එතනින් එහාට කිසි දෙයක් නොලද නිකමකු සරි අනර්ථ ජීවිතයක් ලද බවත්ය. නමුත් ඔවුන් සියල්ලටම අමතක වූ කාරණාව වන්නේ, හත්පෙති මලේ හත්වෙනි පෙත්ත කඩා විසිකොට ඇවිදගන්න බැරි වීත්යාව සනීප කරදෙන්නට ශේන්යාට පුළුවන් වූ බවයි. ඇත්ත, ඇය හත්පෙති මලේ සියලුම පෙති නාස්ති කරමින් තමා වෙනුවෙන් කිසිම දෙයක් ලබා නොගත්ත බව, නමුත් අන්තිමේ තමන්ට අව්‍යාජව සතුටුවිය හැකි පරහිතකාමී දෙයක් කළාය.

ළමා කතාවක පුංචි චරිතයක් ඇසුරෙන් අති විසල් කතාවක් කියන්නට ඉසුරුට මෙහිදී හැකි වන්නේ දීර්ඝ කාලයක් තිස්සේ කවිය තුළ ඔහු ලද හික්මීමයි. බැලූ බැල්මට පෙනෙන බාහිර දේ තුළින් මිනිසුන්ගේ චිත්ත අභ්‍යන්තරය හෝ ඇත්ත ජීවිතය නොදැක ඔවුන්ගේම අඩි රූල් වලින් කිරා මැන තීන්දු තීරණ ගන්නා බොහෝ අයට මෙයින් උගත යුතු දෑ බොහෝය. මිනිසකුගේ සාර්ථකත්වය යනු බාහිර වාස්තවික දෑම නොවන බව මෙහිදී කවියා මතුකරයි. ඊට එහා ගිය මහරු සත්‍යයක් මේ තුළ ගැබ්ව ඇත. අප වෙතම එල්ල කළ දර්පණ තලයක් සේ අපේ ජීවිත ගැන ඥානනයක් ලබා දෙන්න මේ කවියට හැකිවී ඇත්තේ ඒ නිසාය. අප සියළුදෙනා අතම හත්පෙති මල් ඇත. ඒවා කඩා විසිකරන්නේ කොයි වෙලාවේද, කුමකටද යන්න නැවත වතාවක් සිතා බලන්නට මේ කව මහරු උත්තේජනයක් ලබා නොදෙන්නේද?

